**වවුනියා දකුණ ද්‍රවිඩ ප්‍රාදේශීය සභාව**
**වවුනියා දිස්ත්‍රික්කය**
**---------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**-----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත්කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 21 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට වවුනියා දකුණ ද්‍රවිඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශය පිළිබඳ අදහස් දැක්වීම
**-------------------------------------------**

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**------------------------**

ජල සැපයීම් කටයුතුවලට අදාල වර්ග තුනක පරිත්‍යාග භාණ්ඩවල වටිනාකම තක්සේරු කර තොග ලේඛන වලට ගෙනවිත් නොතිබීමෙන්, සමාලෝචිත වර්ෂයේ ගිණුම් ප්‍රකාශනවල අවසන් තොග වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 ලැබියයුතු සහ ගෙවියයුතු ගිණුම්
**--------------------------------------**

**(අ) ලැබියයුතු ගිණුම්**
**-------------------**

රු. 38,280 ක්වූ ලැබුනු ආයුර්වේද ආධාර මුදල් පසුගිය වසර 29 ක සිට සභාව විසින් ප්‍රයෝජනයට නොගෙන තිබුණද, එයට හේතු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

**(ආ) ගෙවියයුතු ගිණුම්**
**-------------------**

ඕමන්ත ක්‍රීඩාංගනයේ නාම පුවරු වටරවුම ඉදිකිරීමේ කර්මාන්තය ඉකුත් වර්ෂයේ නිමකර තිබුණද, එහි කොන්ත්‍රාත්කාර ප්‍රජා මූල ආයතනයක් වෙත ගෙවියයුතුව තිබූ රු. 237,842 ක මුදල මෙතෙක් ගෙවා නොතිබුණි.

### 1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම
**-----------------------------------------------------------**

විගණනය සඳහා තොරතුරු ඉදිරිපත් නොකිරීම
-----------------------------------------------------

ස්ථාවර තැන්පත් වලට අදාල බැංකු විස්තර, බැංකු ගිණුම් අංකය, ස්ථාවර තැන්පත් සහතික, බැංකු ශේෂය සනාථ කිරීම සහතික සහ අත්තිකාරම් ලේඛන යන අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.

1,863,291 ක්වූ වර්ග හතක ස්ථාවර වත්කම්, විගණනයේදී සතුටුදායකව සන්නිරීක්ෂණය කිරීමට නොහැකිවිය.

**1.3.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (i) රීති 217 | - | සභාව විසින් ප්‍රයෝජනට ගනු ලබන ඉඩම් සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) රීති 60 | - | වර්ෂය ආරම්භයේදී සභා බල ප්‍රදේශයේ තිබෙන කර්මාන්ත පිළිබඳ සමීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| මුදල් රෙගුලාසි 571 | 4,030,759 | කල් ඉකුත් තැන්පත් දහයක් සම්බන්ධයෙන් පසුගිය වර්ෂ දෙකකට වැඩි කාලයක් අවශ්‍ය කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවා තිබුණි. |
| (ඇ) උතුරු පළාත් සභා මූල්‍ය රීති | | |
| රීති 407 | | සභාවේ සේවය කරන රියදුරු මහතුන්ගෙන් ඇප මුදල් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් රු. 9,252,868 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම් රු. 7,691,403 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | **2017** | | | | **2016** | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන් තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන් තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් බදු | 3,500,000 | 3,295,230 | 2,379,703 | 2,140,602 | 3,200,000 | 3,242,662 | 2,692,703 | 549,958 |
| (ii) | කුලී | 3,161,554 | 3,161,554 | 2,929,684 | 655,740 | 2,519,450 | - | 2,399,990 | 119,460 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,240,000 | 2,240,000 | 1,868,810 | - | 1,900,000 | - | 1,772,000 | 128,000 |
| (iv) | වෙනත් ආදායම් | 57,387,292 | 15,002,000 | 29,746,385 | - | 7,530,000 | - | 8,348,578 | - |

**2.2.2 වෙනත් ආදායම්**

සභාවට අයත් ජෙසීබී යන්ත්‍රය, මෝටර් ග්‍රේඩරය සහ මෝටර් රෝලරය කුලියට දීම වෙනුවෙන් ලැබියයුතු හිඟ බදුකුලී එකතුව රු. 296,738 ක් පසුගිය වර්ෂ 5 කදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

උතුරු පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 6,487,831 ක හා මුද්දර ගාස්තු රු. 2,449,626 ක් විය.

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්‍ය සාධනය**

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

පහත කරුණු නිරික්ෂණය විය.

(i) කසල බැහැර කරන ස්ථානයන් සඳහා පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ii) සෞඛ්‍ය කම්කරුවන් වාර්ෂික වෛද්‍ය පරීක්ෂවලට භාජනයකර නොතිබුණි.

(iii) අපද්‍රව්‍ය වර්ගීකරනය කර ලබා ගෙන නොතිබුණි.

(iv) සභාවේ කසල බැහැර කරන ස්ථානවලට ලැබෙන කසල වර්ගීකරණය කිරීමට අවශ්‍ය වැඩ පිළිවෙලක් ආරම්භකර නොතිබුණි.

(v) අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ නිලධාරීන්ට පුහුණු ලබාදී නොතිබුණි.

(vi) අපද්‍රව්‍ය කළමනාකරණ අවශ්‍ය තොරතුරු සහ දත්ත ක්‍රමයක් පවත්වා නොතිබුණි.

(vii) ඝණ අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරනයෙන් තොරව පරිසරය දූෂණය වන ආකාරයට ගිණි තබා පුළුස්සනු ලැබේ.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

---

සභා බලප්‍රදේශයේ තිබෙන දේපල පසුගිය වර්ෂ 11 ක් තුලදී නව තක්සේරු කිරීම් සිදුකර, වරිපනම්බදු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

**3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

---

විවිධ තැන්පත්වල මාස 4 ක් රඳවාගෙන තිබු රු. 607,457 ක් වූ වැට්බදු 06 ක් පිළිබඳ කරුණු විගණනය හෙළිදරව් කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

---

**3.4.1 නිෂ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්**

---

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පළාත් නිශ්චිත සංවර්ධන ආධාර යටතේ සභාව විසින් ඉදිරි කරන ලද රු. 814,719 ක් පිරිවැයට ඉදිකරන ලද කෝනික්කල් සතිපොළ ගොඩනැගිල්ල වර්ෂ දෙකක කාලයක් අදාල අරමුණ සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රු. 1,599,366 ක පිරිවැයට සමාලෝචිත වර්ෂයේදී ඉදිකරන ලද කල්නාට්ටියකුලම් උද්‍යානය මාස හයකට වැඩි කාලයක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**3.4.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

---

ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ වශයෙන් හඳුනාගෙන තිබු තොග භාණ්ඩ 125 ක් සම්බන්ධයෙන් 2009 නොවැම්බර් 13 දින හා අංක 438 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කටයුතු කර නොතිබුණි.

**3.4.3 පවරා නොගත් වත්කම්**

---

සභාව වෙත පවරා නොතිබූ වාහන 23 ක් පසුගිය වර්ෂ 03 ක් තුල සභාව විසින් ප්‍රයෝජනයට ගෙන තිබු බව නිරීක්ෂණය විය.

## 4 ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

අයවැය ගත ආදායම සහ තථ්‍ය ආදායම අතර අහිතකර රු. 217,144 ක් සිට හිතකර රු. 4,828,994 ක් දක්වා නොහොත් සීයට 6.20 සිට සීයට 69.48 දක්වා විචලනයක්ද, ඇස්තමේන්තු ගත වියදම් සහ තථ්‍ය වියදම් අතර අහිතකර රු. 371,631 ක් සිට හිතකර රු. 3,657,998 ක් දක්වා නොහොත් එය සීයට 107.65 සිට සීයට 10.87 දක්වා විචලනයන් නිරීක්ෂණය විය.

## 5 පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩු |
|---|---|
| (අ) වත්කම් / දේපල | (i) ලේඛන ගත නොකිරීම. |
| | (ii) ආරක්ෂා කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) තොග | (i) භාණ්ඩ තොග ලේඛනයේ ඇතුලත් කර නොතිබීම. |
| | (ii) අනිසි තොග පාලනය. |